# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 144 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 26/01/2024 පැය 1140

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයක් - වාහල්කඩ පොලිස් වසම.**

2024.01.25 වන දින රාත්‍රී කාලයේදී වාහල්කඩ පොලිස් වසමේ කුඩාගල්ලිදවැව කහටගොල්ලැව ප්‍රදේශයේදී කාන්තාවකට උදැල්ලකින් පහරදී ඝාතනය කර ඇති බවට වාහල්කඩ පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 54 ක් වූ කුඩාගල්ලිදවැව කහටගොල්ලැව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය ඉහත ලිපිනයේ ඇගේ පුරුෂයා, පුතා, විවාහක දියණිය සමඟ ජීවත්ව සිට ඇති අතර දියණියගේ ස්වාමි පුරුෂයා විසින් පැවැති ආරවුලක් මත මෙම පහරදීම සිදුකර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇත.

මෘත ශරීරය පොලිස් ආරක්ෂාව යටතේ එම ස්ථානයේ ඇති අතර මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කිරීමට නියමිතව ඇත. වාහල්කඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - දොම්පේ පොලිස් වසම.**

2024.01.25 වන දින සවස් කාලයේ දොම්පේ පොලිස් වසමේ හංවැල්ල පූගොඩ මාර්ගයේ තිත්තපත්තර ප්‍රදේශයේදී හංවැල්ල දෙස සිට පූගොඩ දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගය හරහා ගමන්ගත් පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා දොම්පේ රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වන කඩේගෙදර, තිත්තපත්තර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දොම්පේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සිදුකල ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර දොම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - නාරම්මල පොලිස් වසම.

2024.01.25 වන දින උදෑසන කාලයේ නාරම්මල පොලිස් වසමේ නාරම්මල කුරුණෑගල මාර්ගයේ මීවැව ප්‍රදේශයේදී නාරම්මල දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ ලොරි රථයක් විරුද්ධ දිසාවෙන් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු නාරම්මල රෝහලට ඇතුලත් කිරිමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වන පිදුරුවැල්ල, උහුමීය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාරම්මල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සිදුකල ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර නාරම්මල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - කොස්ලන්ද පොලිස් වසම.

2024.01.25 වන දින රාත්‍රී කාලයේ කොස්ලන්ද පොලිස් වසමේ කොස්ලන්ද වැල්ලවාය මාර්ගයේ 212/7 බෝක්කු කණුව අසලදි වැල්ලවාය දෙස සිට හිවැල්කදුර දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාර්ගයෙන් ඉවතට පැන පෙරලීමෙන් අනතුරක් සිදු වී ඇත.

අනතුරින් ත්‍රීරෝධ රථයේ රියදුරු සහ පිටුපස ගමන් ගත් කාන්තාවන් දෙදෙනෙකු , කුඩා දරුවන් තිදෙනෙකු තුවාල ලබා වැල්ලවාය රෝහලට ඇතුලත් කිරීමේදි කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 54 ක් වන රත්නපුර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වැල්ලවාය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු වැල්ලවාය රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා මොරණාගල රෝහලට මාරු කර යවා ඇත. කොස්ලන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - කටුනායක අධිවේගී මාර්ග කොට්ඨාසය.

2024.01.26 වන අද දින උදෑසන කාලයේ මහබාගේ පොලිස් වසමේ 27 වන කිලෝමිටර් කණුව ආසනයේ දී කඩවත දෙස සිට කෙරවලපිටිය දෙසට ධාවනය වූ ලොරි රථයක එම දිසාවටම ධාවනය වූ විදේශිකයින් රැගෙන් වෑන් රථය ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාලලාබු සිව් දෙනෙකු රාගම රෝහලට ඇතුලත් කිරිමෙන් අනතුරුව එක් පුද්ගලයෙකු මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ ඔස්ට්‍රියා ජාතිකයෙකු වේ.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මහබාගේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.